සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2023 ජනවාරි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2023-02-25
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100.*

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**සීමාසහිත ABC පොදු සමාගමේ** අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂකවරයෙකු පත්කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා විසින් පවත්වන ලද සමාරම්භක රැස්වීමේදී ඔහු විසින් *"කොටස්කරුවන්, සමාගමේ භාරකරුවන් බවත් එම නිසා සමාගම, කොටස්හිමියන්ගේ නියෝජිතයා බවත්"* සඳහන් කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ලේකම්වරයා විසින් සිදුකර ඇති මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද යන්න හේතු සහිතව **පැහැදිලි කරන්න**.

(ලකුණු 03)

(b) "විශ්වසනීය සම්බන්ධතාවය" (Fiduciary relationship) යන පදය **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## **02** වන ප්‍රශ්නය

**සීමාසහිත මදාරා (පෞද්ගලික) සමාගම** සන්නම්නාමයක් සහිත ඇඟළුම් මසා යුරෝපීය රටවලට අපනයනය කිරීමේ ව්‍යාපාරයක නිරතව සිටී. පසුගිය මාස 6 ක කාලය තුළදී සමාගම පහත සඳහන් අවදානම්වලට මුහුණ පා ඇත:

(1) කාර්යබහුල කාලය තුළදී යන්ත්‍රය අඩපණ වීම.

(2) මූල්‍ය ප්‍රකාශනවල තොරතුරු හිතාමතාම වැරදි ආකාරයට ඉදිරිපත් කර ඇත.

(3) ආයතනය විසින් ස්ථාපිත කර ඇති ක්‍රියාපටිපාටිවලට අනුව වැඩ කිරීමට පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවට අනුයුක්ත සේවකයෙක් අසමත්ව ඇත.

(4) අඩු ගුණාත්වය නිසා ගනුදෙනුකරුවන් විසින් නිෂ්පාදිත කිහිපයක්ම ප්‍රතික්ෂේප කර ඇත.

(5) කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යයනය කිරීම සඳහා ලබාගන්නා ලද ණයවල පොලී අනුපාතිකයන් සීඝ්‍ර ලෙස ඉහළ යෑම.

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත එක් එක් අවදානම, වර්ග කළ හැකි අවදානම් වර්ගයත් එම එක් එක් හඳුනාගත් අවදානම මගහරවා ගැනීමට වඩාත් උචිත අවදානම් මගහරවා ගැනීමේ ක්‍රමෝපායකුත් **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

## **03** වන ප්‍රශ්නය

පාර්ශව තුනේ සම්බන්ධතාවය, සහතිකවීමේ කාර්යභාරයක මූලිකාංග 5 න් එකක් වේ. මෙම පාර්ශව තුන වනුයේ වගකිව යුතු පාර්ශවය, පරිශීලකයා සහ පරිචයේ යෙදෙන්නා වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

මෙම පාර්ශව තුනෙහි කාර්යභාරය වෙන් වෙන් වශයෙන් දක්වා එම පාර්ශවයන් එකිනෙකට සම්බන්ධ වන්නේ කෙසේදැයි යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

## **04** වන ප්‍රශ්නය

විගණන ආයතනයක් විසින් විගණන ආයතන මට්ටමේ සහ තනි තනි විගණන මට්ටමේ තත්ත්ව පාලන පද්ධතියක් ස්ථාපිත කර පවත්වාගත යුතුය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංගයක් වශයෙන් ආයතනයක් තුළ ගුණාත්මකභාවය සඳහා වන නායකත්ව වගකීම් **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) තනි විගණන කාර්යභාරයක අධීක්ෂණය (supervision) යටතේ සලකා බැලිය යුතු කරුණු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත ස්ටාර් ලංකා (පෞද්ගලික) සමාගම** *("සමාගම")*, සබන් නිෂ්පාදනය කර, අලෙවි නියෝජිතයන් හරහා බස්නාහිර හා මධ්‍යම පළාත්වල බෙදාහැරීමෙහි නිරතව සිටී. සමාගම අමුද්‍රව්‍ය ඉන්දියාවෙන් ආනයනය කරන අතර, අයිතම කිපයක් දේශීය වෙළෙඳපොළෙන් මිලදී ගනී. සේවකයින් 76 දෙනෙකු කර්මාන්තශාලාව තුලත් 12 දෙනෙකු ගබඩා ප්‍රවාහන ඒකකය තුලත් 5 දෙනෙකු ගිණුම් දෙපාර්තමේන්තුව තුලත් සේවය කරන ලදී.

රටතුල පැවති වසංගත තත්ත්වය හේතුවෙන් සංස්ථාපනය කරන ලද 2020 වර්ෂයේ සිටම සමාගම, බාහිර විගණනයන් සිදුකර නොතිබුණි.

සමාගමේ කළමනාකරණ අධ්‍යක්ෂකවරයා වන **අහමඩ්** විසින් සමාගමේ බාහිර විගණනයක් සිදුකරන ලෙස ඔබගේ වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ඉල්ලීමක් කර ඇත.

මෙවැනි කාර්යභාරයන් සඳහා විවිධ ආකාරයේ ප්‍රමාණවත් මට්ටමේ සැළසුම්කරණයක් අවශ්‍ය බව ජ්‍යෙෂ්ඨ විගණකයෙකු වශයෙන් ඔබ දැන සිටී. තවද, ප්‍රමාණවත් අවප්‍රකාශයන් වීමේ අවදානම තක්සේරු කරගැනීම සඳහා අස්තිත්වය පිළිබඳවත් එහි පරිසරය පිළිබඳවත් අවබෝධයක් විගණක විසින් ලබාගත යුතු බවද ඔබ දැනුවත්ව සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණනයක් ප්‍රමාණවත් පරිදි සැලසුම් කිරීම මගින් විගණකවරයෙකුට ලබාගත හැකි ප්‍රතිලාභ තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) විගණක විසින් **සීමාසහිත ස්ටාර් ලංකා (පෞද්ගලික) සමාගම** පිළිබඳව අවබෝධයක් ලබාගත යුතු ක්ෂේත්‍ර (areas) තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) ප්‍රවර්තන වර්ෂයේ විගණන කාර්යභාරයක් ආරම්භයේදී විගණක විසින් ඉටුකළ යුතු මූලික කාර්යභාර කටයුතු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත බෙල් පොදු සමාගමේ** විගණක වන **ආතර් සිල්වා සහ සමාගම** (වරලත් ගණකාධිකාරී සමාගම), විගණන කමිටුව වෙත විගණන සැළැස්ම ඉදිරිපත් කිරීමේදී, වංචා හඳුනාගැනීම සම්බන්ධයෙන් විගණකට වගකීමක් ඇති බව විගණන කමිටු සභාපතිවරයා විසින් සඳහන් කර ඇත. තවද, ඔහු විසින් සමාගමේ "වංචා" හඳුනාගැනීම සම්බන්ධයෙන් වන විගණකගේ ක්‍රමවේදයද විමසන ලදී.

**සීමාසහිත බෙල් පොදු සමාගමේ** විගණන කටයුතු සිදුකරන අදියරය ආරම්භයේදී, විගණක විසින් විද්‍යුත් විගණන මෙවලමක් (e-audit tool) භාවිත කර ඇත. විද්‍යුත් විගණන මෙවලම තුළ විගණනයේ විවිධ මට්ටම්වලදී යොදාගත යුතු ආකෘති (templates) ඇති අතර, ඒවා "පාලනය පිළිබඳව වගකිව යුතු පාර්ශවයන්" [Those Charged with Governance (TCWG)] සමඟ සිදුකරනු ලබන සන්නිවේදන කටයුතුවල ලේඛණගත කිරීම සඳහා යොදා ගනී. විගණන කණ්ඩායම විසින් පාලනය පිළිබඳව වගකිවයුතු පාර්ශව සමඟ සාකච්ඡා මට්ටමේ පවතින කරුණු ලේඛණගතකරණය කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) අස්තිත්වයක වංචාවන් වළක්වා ගැනීම සහ අනාවරණය කිරීම සම්බන්ධයෙන් විගණකගේ වගකීම **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) වංචා සම්බන්ධයෙන් වන විගණන අවදානම අවම කරගැනීම සඳහා විගණක විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටි දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(c) විගණනයක් සිදුකිරීමේදී පාලනය පිළිබඳව වගකිවයුතු පාර්ශවයන් සමඟ සන්නිවේදනය කළ යුතු ක්ෂේත්‍ර දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**පීටර් සහ සමාගම, පියල් පීටර්ස්** යන එක් හවුල්කරුවෙකුගෙන්, එක් කළමනාකරුවෙකුගෙන් සහ විගණන ආධුනිකයන් 20 දෙනෙකුගෙන් සමන්විත වේ. **සීමාසහිත රිලයබල් පොදු සමාගමේ** විගණක ලෙස පත්කිරීම සඳහා එකී සමාගම විසින් **පීටර් සහ සමාගම** අමතා ඇත. **සීමාසහිත රිලයබල් පොදු සමාගම** යනු මහා පරිමාණයේ ජීවිත රක්ෂණ සමාගමක් වේ. විගණන කාර්යභාරය බාරගැනීමට පෙර විගණන ආයතනයේ කළමනාකරු වන ඔබ විසින් වැදගත් තොරතුරු කිහිපයක් එකතු කරගෙන තිබේ.

පිළිගත නොහැකි ගිණුම්කරණ පරිචයන් භාවිත කිරීම සහ සිදුකර ඇති සැලකිය යුතු වැරුද්දක් නිවැරදි කිරීමක් හේතුවෙන් **සීමාසහිත රිලයබල් පොදු සමාගමේ** පසුගිය වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන යළි ප්‍රකාශයට පත්කර ඇති බවට කොළඹ කොටස් හුවමාරුවෙහි වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කර ඇත. **සීමාසහිත රිලයබල් පොදු සමාගම** මගින් වැරදි තොරතුරු සැපයීම හේතුකරගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය විසින් ද "අනතුරු හැඟවීමේ ලිපියක්" (letter of warning) නිකුත් කර ඇත. තවද, අනෙකුත් ඒ හා සමාන ජීවිත රක්ෂණ සමාගම් සමඟ සැසඳීමේදී සමාගමේ ශුද්ධ ලාභ ආන්තිකය ඉතා ඉහළ අගයක් ගෙන ඇත.

විගණන සේවාදායකයෙකු වශයෙන් **සීමාසහිත රිලයබල් පොදු සමාගම,** විගණන කාර්යභාරය බාර ගන්නේද යන්න පිළිබඳව විගණන හවුල්කරු විසින් ඔබගෙන් උපදෙස් පතා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත රිලයබල් පොදු සමාගමේ** විගණන කාර්යභාරය භාරගැනීමේදී ඔබ විසින් සළකා බලා හවුල්කරුට සන්නිවේදනය කළ යුතු කරුණු තුනක්(03) **විමසන්න.** (ලකුණු 06)

(b) නව විගණන සේවාදායකයෙකු භාරගැනීමේදී වෘත්තීය නිපුණත්වය සහ නිසි සැලකිල්ලට වන අවදානම සම්බන්ධයෙන් විගණකට තිබෙන ආරක්ෂණ ක්‍රම හතරක්(04) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

ඩුබායි රාජ්‍යයෙහි පෞද්ගලික රෝහලක වර්ෂ ගණනාවක් සේවය කිරීමෙන් අනතුරුව **වෛද්‍ය රොෂාන්** පසුගිය වර්ෂයේදී ශ්‍රී ලංකාවට පැමිණ ඇත. 2021 දෙසැම්බර් මාසයේදී ඔහු විසින් ඖෂධ ශාලා දාමයක් පවත්වාගෙන යාමේ බලාපොරොත්තුවෙන් **සීමාසහිත ඔසු මැදුර (පෞද්ගලික) සමාගම** නමින් වූ සමාගමක් ස්ථාපිත කරන ලදි. දැනට සමාගම විසින් මහරගම, නුගේගොඩ සහ අවිස්සාවේල්ල යන ප්‍රදේශවල ඖෂධ ශාලා 3 ක් ස්ථාපනය කර ඇත.

මහරගම ශාඛාව ප්‍රධාන ශාඛාව වන අතර, එමගින් මිලදී ගැනීමේ කටයුතු හා සැපයුම්කරුවන්ගේ ගෙවීම් සිදුකරනු ලබයි. ශාඛා තුන විසින්ම තොග යාවත්කාලීන කිරීම සඳහාම සකස්කරන ලද (tailor-made) මෘදුකාංගයක් භාවිත කරන අතර, එය වඩාත් විශ්වසනීය වන අතර, එහි සියලුම තොරතුරු ද අන්තර්ගත වේ. **වෛද්‍ය රොෂාන්** ට තොග ශේෂයන් ඔහුගේ පරිගණකය හරහා පරීක්ෂා කිරීමටත් එමගින් ම තොග ඇණවුම් සිදුකිරීමටත් පුළුවනි. ඔහු විසින් ඖෂධවේදී පාඨමාලාවක් සම්පූර්ණ කරන ලද හා ඖෂධවේදීනියක ලෙස වසර ගණනාවක් සේවය කරන ලද **කල්පනී** ව බඳවා ගන්නා ලදී. සියලුම භාණ්ඩ ලැබීම් පත් **කල්පනී** විසින් තොග මොඩියුලයට ඇතුළත් කරනු ලබයි.

සැපයුම්කරුවන් තෝරාගැනීම, ඇණවුම් සිදුකිරීම සහ සැපයුම්කරුවන්ගේ ඉන්වොයිසි මත පදනම්ව චෙක්පත් ලිවීම යන සියල්ලක්ම **වෛද්‍ය රොෂාන්** විසින්ම සිදුකරනු ලබයි. කිසිදු ශාඛාවක ණය පදනම මත විකුණුම් සිදුකරනු නොලබයි. මුදල් අයකැමි විසින් එකතු වූ මුදල් දවස අවසානයේදී CDM තැන්පතු යන්ත්‍ර මගින් බැංකුවේ තැන්පත් කරනු ලබයි. කාසි වෙනමම ලාච්චුවක තැන්පත් කරනු ලබයි.

මෑතකදී **වෛද්‍ය රොෂාන්** ඔබගේ විගණන ආයතනය වෙත පැමිණ ඔහුගේ සමාගම සඳහා මූල්‍ය අංශයක් ස්ථාපිත කිරීමට සහාය වන ලෙසට ඉල්ලීමක් කර ඇත. ඔහු විසින්ම ගණකාධිකාරීවරයාගේ කටයුතු සිදුකරන බවත් වැඩිවන ව්‍යාපාර කටයුතු හේතුවෙන් එම කටයුතු සිදුකිරීමට ඔහුට හැකියාවක් නොමැති බවත් ඔබට අනාවරණය විය. තවද, සමාගම වැටුප් ගෙවීමට තරම් වූ ලාභදායිත්වයක් ජනනය කරන බැවින් ඔහුගේ සහභාගීත්වයක් නොමැතිව මෙහෙයුම් කටයුතු සිදුකිරීමටත්, දැනට පවතින මෘදුකාංග පැකේජ හරහා නියාමනය කිරීමටත් ඔහුට අවශ්‍යව ඇත.

තවද, **වෛද්‍ය රොෂාන්** විසින් “පාලන පරිසරය” පිළිබඳව ඔබගෙන් විමසා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත ඔසු මැදුර (පෞද්ගලික) සමාගමේ** අභ්‍යන්තර පාලන දුර්වලතා හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(b) “අභ්‍යන්තර පාලන පද්ධතිය” යන්නෙහි අදහස **වෛද්‍ය රොෂාන් ට පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(c) පාලන පරිසරයක ඔිතැම මූලිකාංග පහක්(05) **සඳහන් කරන්න.** (ලකුණු 05)

(d) **සීමාසහිත ඔසු මැදුර (පෞද්ගලික) සමාගම** සඳහා අවශ්‍යවන ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලීන් තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(e) **සීමාසහිත ඔසු මැදුර (පෞද්ගලික) සමාගම** ට සලකා බැලිය හැකි යෙදවුම් පාලන තුනක්(03) එකිනෙකට උදාහරණයක් බැගින් දක්වමින් **හඳුනා දක්වන්න.** (ලකුණු 06)

(මුළු ලකුණු 25)

## **09** වන ප්‍රශ්නය

**සීමාසහිත ටොයිස් පොදු සමාගම (TPLC),** සෙල්ලම් බඩු ආනයනය කර තොග වශයෙන් විකිණීමේ නිරතව සිටී. දැනට රට තුළ පවතින අහිතකර තත්ත්වය නිසා නිවසේ සිට වැඩ කිරීමට TPLC විසින් ඉඩ ලබා දී ඇති අතර, එම නිසා TPLC තුළ අභ්‍යන්තර පාලනයන් කාර්යක්ෂමව සිදු නොවේ. විකුණුම්, විකුණුම් කොමිස්, වෙළෙඳ ණයගැතියන් හා තොගවලට අදාලව සිදුකරන ලද මූලික සමාලෝචනවලදී [Preliminary Analytical Review (PAR)] උච්චාවචනයන් සහිත සබඳතාවයන් හඳුනාගන්නා ලදී. ඒවා කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කර ඇත.

ශ්‍රී ලංකා රජය විසින් පනවන ලද ආනයන සීමා හේතුකොටගෙන TPLC ට ආනයන කටයුතු සිදුකිරීමට නොහැකි වී ඇත. TPLC විසින් වර්ෂයක් සඳහා ලබාගන්නා ලද ආනයන ණය මෙම වර්ෂයේදී ගෙවිය යුතු වුවත්, එය පියවීමට TPLC ට නොහැකි වී ඇත. බැංකුව විසින් කාල සීමාව දීර්ඝ කිරීමට අපේක්ෂා නොකරයි.

TPLC සතුව සැපයුම්කරුවන් කිහිපදෙනෙකු සිටින නමුත් ආනයන ණයහිමියන් පියවීමට TPLC ට ආයාසයක් දැරීමට සිදුවී ඇත. ගෙවා නොමැති ශේෂ සඳහා දඩ පොලියක් අයකරන බව එම ණයහිමියන් දන්වා ඇත. විගණක විසින් වෙළෙඳ ණයහිමියන්ගෙන් ඍණාත්මක තුන්වන පාර්ශවීය තහවුරු කිරීම් ඉල්ලා ඇත. මෙය වෙළෙඳ ණයහිමියන් වෙනුවෙන් සිදුකරනු ලබන එකම විගණන ක්‍රියා පටිපාටියයි.

ගෙවීම් සිදුකිරීමට ණයගැතියන් දීර්ඝ කාලයක් ලබාගෙන ඇති අතර, සමහරක් ගනුදෙනුකරුවන් ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු නවතා දමා ඇති බවට අලෙවි අංශය විසින් මූල්‍ය අංශයට දන්වා ඇත. ප්‍රමාණවත් අවප්‍රකාශයන් සිදුවීමේ අවදානම ඉහළ බැවින් ව්‍යවස්ථාපිත විගණනයේදී විගණක විසින් වෙළෙඳ ණයගැතියන්ගෙන් බාහිර තහවුරු කිරීම් ඉල්ලා ඇත.

TPLC හි මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම (going concern) පදනම මත පිළියෙල කර ඇත. නමුත් අඛණ්ඩ පැවැත්ම උපකල්පනය සම්බන්ධයෙන් වන විගණකගේ ඇස්තමේන්තුව අනුව අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය භාවිත කිරීම යෝග්‍ය නොවන අතර ඒවා අඛණ්ඩ පැවැත්ම පදනමින් තොරව පිළියෙල කළ යුතුව තිබුණි. එසේ නොකළහොත් විකරණය කරන ලද මතයක් (modified opinion) ඉදිරිපත් කළ යුතුව තිබුණි. TPLC විසින් මූල්‍ය ප්‍රකාශන සඳහා වූ මතය විකරණය නොකරන ලෙසත් වෙනත් කරුණු ඡේදයක් (other matter paragraph) හෝ කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් (emphasis of matter paragraph) ඇතුළත් කරන ලෙසත් ඉල්ලා ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විගණන සාක්ෂි ලබාගැනීම සඳහා බාහිර තහවුරු කිරීම් ලබාගැනීමට අමතරව සිදුකළ හැකි විගණන පටිපාටි තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) ඍණාත්මක තහවුරු කිරීම් සඳහා වන ඉල්ලීම් යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි **යන්න පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(c) TPLC හි මූල්‍ය තොරතුරු සැසඳීම සඳහා විගණක විසින් සිදුකළ හැකි විශ්ලේෂණාත්මක ක්‍රියා පටිපාටි දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(d) අඛණ්ඩ පැවැත්ම උපකල්පනය සම්බන්ධයෙන් සැකයක් ඇතිකරන සිදුවීම් හා තත්ත්වයන් පහක්(05) **හඳුනා දක්වන්න**. (ලකුණු 05)

(e) කරුණක් අවධාරණය කිරීමේ ඡේදයක් ඇතුළත් කිරීමේ අවශ්‍යතාවය සළකා බලමින් සමාගමේ ඉල්ලීම **තක්සේරු කරන්න**. (ලකුණු 04)

(f) TPLC හි මූල්‍ය ප්‍රකාශනවලට අදාලව තත්ත්වාගණනය කරන ලද මතයක් නිකුත් කිරීමේ යෝග්‍ය හෝ යෝග්‍ය නොමැති බව **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අදින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |